# අභයගිරි විහාර සංකීර්ණයේ වාස්තු විද්‍යා ඉදිකිරීම් තුළින් හෙළිවන මහායාන බුදු දහම

# Mahāyāna Buddhism as Reflected in the Architectural Construction of the Abhayagiri Temple Complex

එම්.කේ. එල්. අයිරාංගනී
එන්.ජී.අයි.එම්.වික්‍රමසිංහ

## Abstract

Marking a significant juncture in the Sri Lankan Buddhist order, the Abhayagiri temple complex, which separated from the Mahavihara, evolved into a center for free thinkers, welcoming both Theravada and Mahayana practitioners. This study aims to examine the Mahayana concepts revealed through the distinctive architectural constructions of the Abhayagiriya. Data was collected through field studies, with a comparative analysis of literature sources and archaeological records. During the Anuradhapura period, Abhayagiriya, recognized as a major Mahayana educational center in South Asia, is characterized by several structures that deviate from traditional Sri Lankan monastic features. These include the Dharanigriha, Abhishek Mandapa, Prasada, Mahayana Stupa, Bodhisattva Pratimagruha, and Dhatu Mandir. The Abhishek Mandapa was used for the Buddha Abhishek, Bodhisattva Abhishek, and Bhikshu Abhishek rituals of Mahayana Buddhism, while the Bodhisattva Pratimagruha served as a pilgrimage site with Mahayana Bodhisattva statues for those engaged in Bodhisattva practices. Dharani Stones with Dharani Mantras, found around Dharani Houses and Mahayana Stupas, are excerpts from Mahayana

Sutras and were used as mantras for peace and protection. The Dhatu Mandir at Abhayagiri exemplifies the efforts of the Abhayagiri monks, who aimed to attract the public more than the Mahaviharikas, by displaying sacred Buddhist objects. It was an open space for the public to enshrine and venerate the Buddha's tooth. The identified architectural constructions reflect Mahayana concepts, and their continued existence is also explored through research. This confirms that Mahayana architectural elements were the main reason Abhayagiri became renowned as a Mahayana center.

**Keywords:** Abhayagiriya, Mahayana, Architecture, Dharani, Abhisheka

**හැඳින්වීම**

ගෞතම බුදුන් වහන්සේ ජීවමාන අවධියේ පටන්ම බුද්ධ දේශිතය සම්බන්ධයෙන් දේවදත්ත තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යයින් සහ සුභද්‍ර භික්ෂුව වැනි විවිධ මතදැරුවන් වරින්වර ඉස්මතු වී ඇතත් බොදු භක්තියත්, බුදුන් වහන්සේ වටා පැවති සමාජීය බලයත් හේතු කොටගෙන එම මතවාදයන් ව්‍යාප්ත වීම වැළකී තිබේ. නමුත් සම්බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව මෙම මතයන්ට අවස්ථාව හිමි විය. ඒ අනුව වැඩි කාලයක් ගත වීමට මත්තෙන් ථෙරවාදී - මහායාන වශයෙන් නිකාය දෙකක් ලෙස බුද්ධ ශාසනය ඛණ්ඩනය වන අතර මහායානය ද විවිධ අනු නිකායන්ට බෙදෙමින් වර්ධනය වී ඇත. අනුරාධපුර යුගයේ මුල් භාගයේ දී ථෙරවාදී බෞද්ධ මධ්‍යස්ථානය ලෙස ශ්‍රී ලංකාව ක්‍රියාත්මක වනවිට අග්නිදිග ආසියාතික කලාපය මහායාන බලපෑම්වලට නතු වී තිබේ. මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ මුල් බැසගත් බුද්ධ ශාසනයේ ප්‍රධාන සංධිස්ථානයක් සනිටුහන් කරමින් වළගම්බා රජු විසින් අභයගිරි විහාරය කරවා කුම්භීලක මහාතිස්ස තෙරුන්ට පූජා කිරීමත් සමග එතෙක් වර්ධනය වෙමින් පැවති මහාවිහාරීය ථෙරවාදී බලය ඛණ්ඩනය විය. ඉන් අනතුරුව ථෙරවාදය පමණක් ගුරුකොටගත් පිරිස මහාවිහාරය වටා ද, ථෙරවාදය සහ මහායානය ඇතුළු විවිධ

බෞද්ධාගමික මතිමතාන්තරයන් ඇත්තවුන් අභයගිරිය වටා ද ඒකරාශී වී තිබේ.

අභයගිරි ස්තූපය කේන්ද්‍ර කරගනිමින් නිර්මාණය වූ අභයගිරි විහාර සංකීර්ණය ස්තූප, දානශාලා, උපෝසථඝරය, භික්ෂු ආවාස, පොකුණු, ජන්ථාඝර ආදී වූ පුරාවිද්‍යාත්මක නටබුන් රාශියකින් සමන්විත ක්‍රමවත් සේ සැළසුම් කරන ලද විහාරස්ථානයකි. වළගම්බා රාජ්‍ය සමයේ පටන්ම මහායාන සන්නාමය යටතේ වැඩී වර්ධනය වූ මෙය බෞද්ධ සංඝාරාමයක්, විවිධ මත දැරූවන්ට විවෘත සංවාද මණ්ඩපයක්, අධ්‍යාපනික මධ්‍යස්ථානයක් මෙන්ම කර්මාන්ත පරිශ්‍රයක් වශයෙන් ද ක්‍රියාත්මක වූවකි. දක්ෂිණ ආසියාවේ ප්‍රධාන මහායාන මධ්‍යස්ථානයක් වශයෙන් සාහිත්‍ය සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර මගින් තහවුරු කර ඇති මෙහි ධාරණී ගෘහ, මහායාන ස්තූප, අභිෂේක මණ්ඩප, ප්‍රාසාද, බෝධිසත්ත්ව ප්‍රතිමාඝර, ධාතු මන්දිරය සහ විවිධ මහායානික අනන්‍යතාවන්ගෙන් යුතු ඉදිකිරීම් දක්නට හැකිය.

**සාහිත්‍ය විමර්ශනය**

ශ්‍රී ලාංකේය බෞද්ධාගමික මතවාදයන්ට බලපෑ මහායානික සංකල්පයන් විග්‍රහ කර ගැනීමේ දී මොරටුවේ ශාසනරතන හිමියන්ගේ 'ලක්දිව මහායාන අදහස්' කෘතිය මහෝපකාරී වන්නකි. මහායානවාදය මෙරටට ආගමනය වීම, එහි පවත්නා නිකායාන්තර විවිධත්වය, ඇදැහිලි සහ විශ්වාසයන් ශාසනරතන හිමියන්ගේ අවධානයට ලක් වී ඇති අතර ඒ සමගින් දේශීය සංස්කෘතියට එක් වූ බෝධිසත්ත්ව වන්දනය, දේව වන්දනය ආදී සංකල්පයන් ද විග්‍රහ කර තිබේ. උණුවතුරබුබුලේ මහින්ද හිමියන්ගේ 'ලංකා බෞද්ධ සංස්කෘතිය' මගින් මෙරටට බුදු දහම ආගමනය වීමේ පටන් යටත්විජිත අවධිය දක්වාම සිදු වූ විකාශනය විමර්ශනය කර තිබේ. විශේෂයෙන්ම මහායාන දහමේ බලපෑමත් සමග ථෙරවාදයේ සිදුවූ වෙනස්වීම් සහ පසුකාලීන ශාසන කතිකාවත් මගින් ථෙරවාද-මහායාන භේදය වෙත සිදු කරන ලද බලපෑම් වෙත අවධානය යොමුකර තිබේ. වල්පොල රාහුල හිමියන්ගේ 'ලක්දිව බුදු සසුනේ ඉතිහාසය' කෘතිය ඔස්සේ ශ්‍රී ලංකාවේ සමාජය, සංස්කෘතිය, ආර්ථිකය, අධ්‍යාපනය සහ දේශපාලනය ආදී විවිධ අංශයන් කෙරෙහි බුදු දහමෙන් සිදු වූ බලපෑමත් ඒ ඔස්සේ දේශීය ජන ජීවිතය

හැඩගැසුණු ආකාරයත් විග්‍රහ කර ඇත. මහායානවාදය, මහායානයේ එන විවිධ නිකායික බෙදීම්, ශ්‍රී ලංකාවට ආගමනය වූ මහායානික අදහස් සහ මහායානය තුළ පවතින විවිධ විශ්වාසයන් සහ ඇදැහිලි මෙම පර්යේෂකයින්ගේ අවධානයට ලක් වී ඇතත් එම ඇදැහිලි විශ්වාසයන් පැවති බවට තහවුරු කරන්නා වූ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් කෙරෙහි අවධානය යොමු කර නැත. විශේෂයෙන්ම මහායානික ලක්ෂණ සහිත ආරාම නම්කර ඇතත් එම එම ආරාමික ඉදිකිරීම් තුළින් තහවුරුවන මහායානික අදහස් සියුම් විශ්ලේෂණයකට බඳුන්කර නොමැත. පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍ර ගවේශනයන්, කැණීම්, සංරක්ෂණ ආදිය සිදු කරමින් එච්.සී.පී.බෙල් සහ පරණවිතානයන්ගේ සිට මෑතකාලීනව ටී.ජී.කුලතුංග ආදී පුරාවිද්‍යාඥයින් දක්වාම අභයගිරිය අධ්‍යයනයට ලක්කර ඇතත් ඔවුන්ගේ විශේෂ අවධානය යොමු වී ඇත්තේ එහි තාක්ෂණික ඉදිකිරීම් සහ ඓතිහාසික පසුබිම ආදිය කෙරෙහි ය. ප්‍රධාන ගොඩනැගිලි ගණනාවක් මහායාන ලක්ෂණ ඇති බවත්, මහායානික සූත්‍ර අඩංගු පත් ඉරු හමු වීමත් සටහන් කරමින් ඒවායේ මහායාන ආභාසය මොවුන් විසින් යම්තාක් දුරකට තහවුරු කර ඇත. නමුත් මහායාන බුදු දහමේ අභ්‍යන්තරික ලක්ෂණ කෙරෙහි සියුම්ව අවධානය යොමු කරමින් එම ලක්ෂණ සහ මෙම පුරාවිද්‍යාත්මක සොයාගැනීම් අතර පවත්නා අන්‍යෝන්‍ය සබඳතාවය හඳුනාගැනීමට ගත් උත්සහයන් මෙහිදී හමු නොවේ. එහෙයින්ම අප පර්යේෂණය දියත් වන්නේ එකී පර්යේෂණ රික්තකය කේන්ද්‍ර කරගනිමිනි.

**පර්යේෂණ ගැටලුව සහ අරමුණ**

අභයගිරි විහාර සංකීර්ණයෙහි පවත්නා මහායානික මතවාදය පිළිබඳ සාහිත්‍ය, පුරාවිද්‍යාත්මක, ඓතිහාසික ආදී වශයෙන් සිදු කළ ගවේෂණයන් කිහිපයක්ම හමු වූව ද එහි ඇති වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් සාමූහිකව අධ්‍යයනය කළ අවස්ථාවන් විරලය. විශේෂයෙන්ම මෑතකාලීන සංරක්ෂණයන්ගෙන් පසු ඒවායෙහි තත්ත්වය, කලාත්මක අගය හා පුරාවිද්‍යාත්මක වටිනාකම, කැණීම් මගින් හමු වු පුරාවස්තුන්ගේ වැදගත්කම ආදී කරුණු ඔස්සේ මහායාන මත පිළිබඳ සිදුකළ විග්‍රහයක් හමු නොවේ. අභයගිරියේ වාස්තු විද්‍යා ඉදිකිරීම් තුළින් ගම්‍යමාන මහායාන මතවාද කෙබඳු ද යන පර්යේෂණ

ගැටලුව මත පදනම්වන මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ අභයගිරි ගොඩනැගිලි තුළින් හෙළිවන මහායාන මතවාද සියුම්ව විමසා බැලීමයි. එම ඉදිකිරීම්වල වර්තමාන තත්ත්වය, ඒවායෙහි ආරාමික උපයෝගීතාවය, වාස්තු විද්‍යා ශිල්ප ක්‍රමය මෙන්ම කලාත්මක ලක්ෂණ ද මෙතුළින් අධ්‍යයනය කෙරේ.

**ක්‍රමවේදය**

අභයගිරි විහාර සංකීර්ණයට අයත් වාස්තු විද්‍යා නිර්මාණ තුළින් හෙළිවන මහායාන සංකල්පයන් හෙළිකරගනුවස් සිදුකරනු ලබන මෙම පර්යේෂණයේ දී අභයගිරිය, ජේතවනාරාමය, විජයාරාමය, පන්කුලිය, තොළුවිල ආදී වූ මහායානික සංකල්පයන් ගැබ් වූ පුරාවිද්‍යා පරිශ්‍රයන් ක්ෂේත්‍ර අධ්‍යයනයට භාජනය කරන ලදි. එහිදී විශේෂ කොට අභයගිරි විහාර සංකීර්ණයට අයත් භූමි භාගය සම්පූර්ණයෙන්ම ගවේශනය කරමින් අභයගිරි පුරාවිද්‍යා කෞතුකාගාරය ද නිරීක්ෂණය කළ අතර මහායාන-ථෙරවාදී ඉදිකිරීම්හී පවත්නා වෙනස්කම් හඳුනාගනු වස් මහාවිහාරය සහ මිරිසවැටිය ද නිරීක්ෂණයට බඳුන් කරන ලදි. පුරාතන සාහිත්‍ය මූලාශ්‍රයන් සහ සෙල්ලිපි මගින් බොහෝ දත්තයන් හඳුනාගත හැකි විය. විශේෂයෙන්ම පෙර සාහිත්‍ය විචාරයෙහි දක්වා ඇති එච්.සී.පී.බෙල්ගේ සිට ටී.ජී කුලතුංගයන් දක්වාම වූ පුරාවිද්‍යාඥයින් සහ ඉතිහාසඥයින්ගේ වාර්තාවන් ගැඹුරින් විමර්ශනය කරන ලදි. මෙලෙස රැස්කරගත් සියලු දත්තයන් ඓතිහාසික සංසන්දනාත්මක ක්‍රමවේදය(Historical–Comparative method) සහ විස්තරාත්මක ක්‍රමවේදය (Descriptive method) ඔස්සේ විග්‍රහ කරමින් අභයගිරි පුරාවිද්‍යා පරිශ්‍රයෙහි ඇති වාස්තු විද්‍යා ඉදිකිරීම් තුළින් හෙළිවන මහායාන සංකල්පයන් ගැඹුරින් අධ්‍යයනය කරමින් අවසාන නිගමනය වෙත එළඹීමට හැකි විය.

**පර්යේෂණයේ වැදගත්කම**

ථෙරවාදය ගුරු කොටගත් ශ්‍රී ලාංකේය භික්ෂු ශාසනයේ ඓතිහාසික කඩයිම් ලක්ෂ්‍යයක් බවට පත් වෙමින් දකුණු ආසියාවේ මහායාන මධ්‍යස්ථාන අතර ප්‍රබල ස්ථානයක සටහන් වූ අභයගිරිය ශ්‍රී ලාංකේය මූලාශ්‍ර රචකයින් අතින් ගිලිහී ගිය භික්ෂු මධ්‍යස්ථානයකි. නමුත් පවත්නා සාහිත්‍ය මූලාශ්‍රය සාධක පුළුල්ව අධ්‍යයනය කරමින්,

සෙල්ලිපි හා පුරාවිද්‍යා නශ්ටාවශේෂ වෙත අවධානය යොමු කිරීමේ දී අභයගිරිය වූ කලී විශිෂ්ට ආගමික හා අධ්‍යාපනික මධ්‍යස්ථානයක් බව හඳුනාගත හැකි වේ. පූර්ව පර්යේෂකයින් විසින් අභයගිරියේ ඓතිහාසිකත්වය, එහි කලාව, නටබුන්, සංරක්ෂණ ආදිය පිළිබඳ පුළුල්ව අධ්‍යයනයන් සිදු කර තිබේ. නමුත් මෑතකාලීනව සිදු කළ කැණීම් අවසාන වූ පසු අභයගිරියේ නටබුන් පරිශ්‍රය අධ්‍යයනය කරමින් එම පරිශ්‍රයේ හා මහායාන භික්ෂූන් අතර ඇති බැඳීම පිළිබඳ සිදු කෙරුණු පර්යේෂණ හඳුනාගත නොහැකි වේ. සාහිත්‍ය මූලාශ්‍රය, පුරාවස්තු සහ වාස්තු විද්‍යා ඉදිකිරීම් මත පිහිටා අභයගිරියේ මහයාන මතවාදය බොහෝ විද්වතුන්ගේ විග්‍රහයන්ට ලක්ව ඇතත්, එම වාස්තු විද්‍යා ඉදිකිරීම් පමණක් ගැඹුරින් අධ්‍යයනය කරමින් එහි ඇති ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සහ කලාත්මක වටිනාකම ඔස්සේ ආගමික හරය පිළිබඳ විචක්ෂණශීලීව විවරණය කළ අවස්ථාවන් විරල වන අතර ඊට සමගාමීව එම ඉදිකිරීම්වල මෑතකාලීන තත්ත්වය ද ඉස්මතු කළ අවස්ථාවන් හමු නොවේ. එහෙයින් නූතනය තුළ සිටිමින් අනුරාධපුර අවධියේ පැවති දේශීය මහායානික ඇදැහීම් පිළිබඳ අධ්‍යයනය කිරීම පිළිබඳ පවත්නා වූ පර්යේෂණ රික්තකය පූරණය කරන වස් මෙම අධ්‍යයනය මහෝපකාරී වේ.

### ප්‍රතිඵල හා සාකච්ඡාව


ගැඹුරු ජීවන දර්ශනයක් ආසියාතික කලාපය පුරා ප්‍රචාරය කරන්නට සමත් වූ ගෞතම බුදුන් වහන්සේ විසින් ජීවිතයේ අවසාන පරමාර්ථය වශයෙන් නිර්වාණය පෙන්වා දුන් අතර නිර්වාණය ළඟා කරගැන්ම උදෙසා සෝවාන්, සකෘදාගාමී, අනාගාමී සහ මහරහත් යන මාර්ගඵලයන්ට පත්විය යුතු බව දේශනා කර ඇත. නමුත් බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අනතුරුව ක්‍රමයෙන් බෞද්ධ දර්ශනය ද විවිධ වෙනස්කම්වලට භාජනය වෙමින් ථෙරවාද සහ මහායාන වශයෙන් ප්‍රධාන නිකාය දෙකකට බෙදී ගිය. ථෙරවාදීන් මාර්ගඵල සහිත නිර්වාණය අපේක්ෂා කරන විට මහායානිකයන් මාර්ගඵල වලට වඩා උසස් වූ බුද්ධත්වය අපේක්ෂා කළහ. සෑම පුද්ගලයෙකුටම බුදු බව ලැබිය හැකි බවත්, ඒ සඳහා බෝධිසත්ව චර්යාවෙහි නිරත විය යුතු බවත් ඔවුහු විශ්වාස කළ හ. මුල් අවධියෙහි මහායාන බුදු දහම බෙහෙවින්ම ප්‍රචාරය වූයේ අග්නිදිග ආසියාතික

කලාපයේ ය. සෑම පුද්ගලයෙකුටම බෝධිසත්ත්වයෙකු වීමට හැකියාව ඇති බව විශ්වාස කළ මහායානිකයන් මිනිසෙකුගේ ජීවිතයේ අරමුණ විය යුත්තේ බෝධිසත්ත්ව භාවයට පැමිණීම බව පිළිගත් හ. (මහින්ද හිමි, 2018, 101) ථෙරවාදීන් රහත් බව අපේක්ෂා කිරීම ආත්මාර්ථකාමී ක්‍රියාවක් සේ දුටු ඔවුහු බෝධිසත්ව බව ඔස්සේ බුද්ධත්වයට පත් වීමෙන් ලෝකයට ඉමහත් සේවයක් කළ හැකි බව ප්‍රකාශ කර ඇත. එහෙයින්ම බෝධිසත්ත්ව චර්යාවෙහි නිරත වීමට ඔවුහු යොමු වී තිබේ. ආමිස පූජාවන්ට සහ පිළිම වන්දනයට ද ප්‍රධාන ස්ථානයක් ලබා දී ඇති මහායානිකයන් අවලෝකිතේශ්වර, වජ්‍රපානී, නාථ වැනි බෝධිසත්ත්වයින්ට වන්දනාමාන කිරීමට පෙළඹී ඇත. සූත්‍ර පිටකය, විනය පිටකය, අභිධර්ම පිටකය, මිශ්‍ර පිටකය සහ ධාරණී පිටකය යනුවෙන් පිටක පහකින් යුතු මහායාන බුදු දහම බෙහෙවින්ම ප්‍රකාශයට පත්ව ඇත්තේ සංස්කෘත භාෂාවෙන් ය. (සාසනරතන හිමි, 2012, 34) ඔවුහු අෂ්ට සාහශ්‍රිකා ප්‍රඥාපාරමිතා සූත්‍රය, සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, ලලිත විස්තර සූත්‍රය, ලංකාවතාර සූත්‍රය, ස්වර්ණ ප්‍රභාස සූත්‍රය, ගණ්ඩ ව්‍යූහ සූත්‍රය, තථාගත ග්‍රහසායක සූත්‍රය, සමාධි රාජ සූත්‍රය සහ දශ භූමිශ්වර සූත්‍රය වැනි සූත්‍ර ගුරු කොටගත්හ. (මහින්ද හිමි, 2018, 102)

මහායානිකයන්ගේ ශ්‍රී ලාංකේය ආගමනය මහින්දාගමනය අවධියේ පටන්ම සියුම්ව හඳුනාගත හැකි වුව ද එය මෙරට තුළ ස්ථාපිත වන්නේ වළගම්බා රාජ්‍ය සමයේ දී ය. වළගම්බා රජු විසින් අභයගිරි විහාරය කරවා එය තමන්ට හිතවත් කුම්භීලක මහා තිස්ස භික්ෂුවට පූජා කිරීමත් සමග මහාවිහාරවාසී ථෙරවාදීන් එය භික්ෂු විනය කර්ම කඩ කිරීමක් ලෙස සැලකූ හෙයින් බහලුමසුතිස්ස භික්ෂුව ඇතුළු කුම්භීලක මහා තිස්ස හිමිගේ ශිෂ්‍යයින් පිරිසක් මහාවිහාරයෙන් වෙන් වී අභයගිරියේ වාසයට පැමිණ ඇත. (මහාවංසය, 2007, 33, 95-100, 143) ඉන් අනතුරුව අභයගිරියත්, මහාවිහාරයත් අතර විවිධ මතවාදී ගැටුම් ඇති වූ අතර අභයගිරිය නිර්වාණගාමී බුදු දහම ඉක්මවා යමින් විවිධ මතිමතාන්තර සඳහා නිදහස් ස්ථානයක් ලෙස ක්‍රියා කර තිබේ. එය වඩාත් තහවුරු වන්නේ ඉන්දියාවේ පල්ලවාරාමයේ මහායානික වාත්සී පුත්‍රිය නිකායට අයත් ධර්මරුචි ආචාර්යවරයාගේ ශිෂ්‍ය භික්ෂු පරම්පරාව අභයගිරියේ නේවාසික වීමත් සමගිනි (මහින්ද හිමි, 2018, 103). ඉන් අනතුරුව අභයගිරිය කේන්ද්‍ර කරගනිමින් මහායානය වැඩී

වර්ධනය වන අතර වෝහාරිකතිස්ස රජු විසින් කපිල ඇමතිවරයා යොදවා විනය පරීක්ෂණයක් කර වෛතුල්‍යවාදී ග්‍රන්ථ විනාශ කර එම භික්ෂූණ්ට ද නිග්‍රහ කළ බව මහාවංසය සඳහන් කරයි. ගෝඨාභය රාජ්‍ය සමයේ සංඝමිත්‍ර භික්ෂුවගේ පැමිණීමත් එම භික්ෂුවගේ මෙහෙයවීම මත මහසෙන් රජු විසින් මහාවිහාර භූමියේ ජේතවන ස්තූපය කරවීමත් ලංකාවේ මහායාන සම්ප්‍රදායේ වැදගත් අවස්ථාවක් වන අතර සිලාකාල රජුගේ සමයේ දී ධර්මධාතුව නම් වූ වෛතුල්‍යවාදී ග්‍රන්ථයක් රැගත් භික්ෂුවක් මෙරටට පැමිණි ඇත. (මහාවංසය, 2007, 40, 37-40, 185) ඒ අවස්ථාවේ දී මහාවිහාරවාසී ජෝතිපාල භික්ෂුව මැදිහත් වී වෛතුල්‍යවාදය ව්‍යාප්ත වීම පිටුදැක ඇතත් අභයගිරිවාසීන් විසින් ඒ සමග ගෙන ආ කේෂධාතුව පිළිගෙන තිබේ. බුදුන් වහන්සේගේ ධාතු වන්දනා කරමින් මහජන ආකර්ශනය දිනා ගැනීම මහායානිකයන්ගේ ලක්ෂණයක් වන අතර කීර්ති ශ්‍රී මේඝවර්ණ රජ සමයේ මෙරටට ගෙන ආ දළදාව ද අභයගිරිකයන් අත්පත්කර ගත්හ. (මහාවංසය, 2007, 37, 92-97, 167) මෙසේ අනුරාධපුර අවධිය අග භාගය වනවිට දකුණු ආසියාවේ ප්‍රධානතම මහායාන මධ්‍යස්ථානයක් වශයෙන් අභයගිරි විහාර සංකීර්ණය ප්‍රසිද්ධත්වයට පත් විය. කුෂ්ඨරාජගල, බුදුරුවගල සහ දඹේගොඩ වැනි ස්ථානවල අවලෝකිතේශ්වර සහ නාථ යන බෝධිසත්ත්වයින්ගේ ප්‍රතිමාවන් ද, තාරා දෙවඟනගේ ප්‍රතිමාවන් ද දක්නට හැකිය. හතරවන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපි, ත්‍රිකායස්ථව ලිපිය සහ බුද්ධත්වය අපේක්ෂා කරමින් ක්‍රි.ව.හත්වැනි සියවසින් පසු කරවූ සෙල්ලිපි ද, අභයගිරිය, මිහින්තලේ ඉඳිකටුසෑය, යටාල ස්තූපය වැනි ස්තූප ආශ්‍රිතව හමු වූ මහායාන සූත්‍ර පාඨ අඩංගු ධාරණී මන්ත්‍ර (මහින්ද හිමි, 2018, 109) ද ශ්‍රී ලංකාව කෙරෙහි පැවති මහායාන බලපෑමට සාක්ෂ්‍ය වේ. මීට අමතරව දේශීය සාහිත්‍ය තුළින් ද මහායානික සංකල්ප විද්‍යාමාන වේ. ථෙරවාදී භික්ෂුවක විසින් රචිත මහාවංසය තුළ පවා දුටුගැමුණු රජු බෝධිසත්ත්ව වරයෙකුගේ අගසව් වන බව (මහාවංසය, 2007, 32, 81, 138) දක්වන අතර මහාවිහාරයෙහි නේවාසිකව සිටි බුද්ධඝෝෂ භික්ෂුව බෝධිසත්ත්වයෙකු බව පාළි අට්ඨකතා දක්වයි. (මහින්ද හිමි, 2018, 106) අනුරාධපුර අවධියෙන් පසුව ලියැවුණු බුත්සරණ, අමාවතුර, පන්සිය පනස් ජාතක කතා, සිදත් සඟරාව, එළු අත්තනගලු වංශය, පූජාවලිය සහ කාව්‍යශේඛරය වැනි ග්‍රන්ථ ගණනාවක ද, කෝට්ටේ අවධියේ ලියැවුණු සංදේශ කාව්‍ය

තුළ ද වරින් වර මෙම මහායානික සංකල්ප අන්තර්ගත වී තිබීම හේතුවෙන් ථෙරවාදී බුදු දහම තුළට ද මහායාන සංකල්ප අන්තර්ගත වී ඇති බවත් ක්‍රමයෙන් එය ශ්‍රී ලාංකේය බුදු දහමේ එක් කොටසක් බවට පත් වූ බවත් හඳුනාගත හැකිය.




සිතියම අංක 01 : අභයගිරි විහාර සංකීර්ණයට අයත් මහායාන වාස්තුවිද්‍යා ඉදිකිරීම්

1. බෝධිසත්ත්ව ප්‍රතිමාගෘහය
2. ප්‍රතිමාගෘහය
3. ධාරණී ගෘහය
4. අභිෂේක මණ්ඩපය
5. ධාතු මන්දිරය
6. මහායාන ස්තූපය
7. අභිෂේක මණ්ඩපය

8. ප්‍රාසාදය

9. ස්තූපය

අභයගිරි විහාර සංකීර්ණයට අයත් වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් තුළින් හෙළිවන මහායාන සංකල්පය වෙත අවධානය යොමු කිරීමේ දී ඊට පාදක කරගත හැකි ඉදිකිරීම් කිහිපයක් ඉහත සිතියමෙහි දක්වා ඇති ආකාරයෙන් හඳුනාගත හැකි විය. අභයගිරි ස්තූපය කේන්ද්‍රගත කරගනිමින් අක්කර ගණනාවක විහිදී ඇති මෙම විහාර සංකීර්ණයෙහි ඉහත දක්වූ ඉදිකිරීම්වලට අමතරව බෝධිඝර, ප්‍රතිමාඝර සහ අභයගිරි ස්තූපය ද විවිධ මහායාන මතවාදයන් සම්බන්ධ සාක්ෂි උසුලා සිටින අතර මහාවිහාරය වැනි ථෙරවාදී විහාර සම්ප්‍රදායන් තුළින් ඒවා ව්‍යුක්ත වේ. මෙම ගෘහ නිර්මාණයන් ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් සියුම්ව නිරීක්ෂණය කරන ලද අතර ඒ වනවිටත් එයින් බොහෝමයක් අභයගිරි ව්‍යාපෘතිය මගින් කැණීම් කර සංරක්ෂණයට බඳුන්කර පැවතිනි. දීඝ පාෂාණය ආශ්‍රිත ප්‍රදේශය තරමක් වනගහනයකින් යුක්ත වූ අතර මෙම අධ්‍යයනයේ පහසුව උදෙසා එම එක් එක් වාස්තු නිර්මාණයන්හී ඇති වර්තමාන තත්ත්වය පළමුකොට අධ්‍යයනය කිරීම වඩාත් සුදුසුය.



1. බෝධිසත්ත්ව ප්‍රතිමාගෘහය



1. බෝධිසත්ත්ව ප්‍රතිමාගෘහය

එහිදී ප්‍රථමයෙන්ම අප අවධානයට පාත්‍ර වූයේ අභයගිරි ස්තූපයට තරමක් නැගෙනහිරින් පිහිටි බෝධිසත්ත්ව ප්‍රතිමාගෘහය (අංක:1) යි. සුප්‍රසිද්ධ අනුරාධපුර සමාධි බුද්ධ ප්‍රතිමාව සහිත බෝධිඝරයට ඊසාන දෙසින් ස්ථාපනය කර ඇති මෙම බෝධිසත්ත්ව ප්‍රතිමාගෘහය බටහිර දිශාවට මුහුණලා පිහිටවූ ද්වාරයකින් යුක්ත වේ. මෙහි සිදුකළ කැණීම් මගින් හුණු ගලින් කරවූ බෝධිසත්ත්ව ප්‍රතිමාවක

කොටස් හමු වූ අතර මහාවංශයෙහි සඳහන්ව ඇති ධාතුසේන රජු විසින් බෝගෙයට වම්පසින් කරවූ බෝධිසත්ත්ව ප්‍රතිමාගෘහය මෙය බව තහවුරු කරගෙන ඇත. (මහාවංසය, 2007, 38, 67, 178) පියගැට පහකින් යුත් ප්‍රධාන ද්වාරයෙන් වේදිකාවක් වෙත ප්‍රවේශ විය හැකි අතර ඒ මත මණ්ඩපයකින් සහ ගර්භ ගෘහයකින් යුතු ප්‍රතිමාගෘහය නිර්මාණය කර ඇත. බටහිර දෙසට මුහුණ ලා ඇති මණ්ඩපයේ ප්‍රධාන ද්වාරයට අයත් එක් පියගැටයක් සහ දොරගල ශේෂ වී ඇති අතර මණ්ඩපයේ සිට දකුණු පසට බැස යාමට ඇති අමතර ද්වාරයට අයත් එක් පියගැටයක් පමණක් දැනට දක්නට හැකි වේ. ගල් කණු 4×4 ප්‍රමාණයේ වූ ගර්භ ගෘහයට අයත් ගල් කණු තුනක් පමණක් නිරුපද්‍රිතය. ගර්භ ගෘහය තුළ ස්ඵටික හුණු ගලින් කරවූ ආසනයක් මත පිහිටුවා ඇති පද්ම පීඨයක් සහ ඊට දෙපසින් ස්ඵටික හුණු ගලින් කරවූ චතුරස්‍රාකාර ආසන ද්විත්වයක් ද තැන්පත් කර ඇත. මේ අනුව ප්‍රධාන බෝධිසත්ත්ව ප්‍රතිමාවට අමතරව පරිවාර බෝධිසත්ත්ව ප්‍රතිමා ද මෙහි තැන්පත් කර පවතින්නට ඇති බව අනුමාන කළ හැකි වේ. ගෘහය සහිත වේදිකාවෙන් ජලය බැස යාම පිණිස ශෛලමය කාණු සහ පිහිලි පද්ධතියක් ද යොදා ඇති මෙය වර්තමානය වනවිට සංරක්ෂණය කර පවතී.



2. ප්‍රතිමාගෘහය



2. ප්‍රතිමාගෘහය

පර්යේෂණයේ දී දෙවනුව ක්ෂේත්‍ර අධ්‍යයනයට පාත්‍ර වූයේ ද මෙවැනිම ප්‍රතිමාගෘහයකි. (අංක:2) අප සාකච්ඡා කළ බෝධිසත්ත්ව ප්‍රතිමාගෘහයට තරමක් උතුරු දෙසින් තාර යෙදූ මාර්ගය ආසන්නයේම පිහිටුවා ඇති මෙම ගොඩනැගිල්ල ද ප්‍රතිමාගෘහයකි. දකුණු දිශාවට මුහුණලා පිහිටවූ ද්වාරයක් සහිත මෙය අප අධ්‍යයනයට බඳුන්වන විට සංරක්ෂණය කර පැවති හෙයින් ඉදිකිරීම් ලක්ෂණ හඳුනාගැනීම වඩාත් පහසු විය. ප්‍රවේශ ද්වාරයෙහි කැටයම් රහිත සරල සඳකඩපහණක්,

පෙන පහකින් ආවරණය වී හිඳින මහාරාජ ලීලාවෙන් යුතු නාගරාජ රුවක් සහිත මුරගල් ද්විත්වයක් එහි දක්නට හැකි වේ. එම නාගරාජ රුවෙහි පෙන කොටස මුරගලෙන් ඉස්මතුව පෙනෙන සේ නෙළා ඇති ආකාරය අලංකාර වේ. නා රජුට දෙපසින් වාමන රූප ද්විත්වයකි. මුරගල් දෙකෙහි පැති පාර්ශවයෙහි කුළුණක් මත ලැග සිටින ගව රූපයක් ද කැටයම් කර තිබේ. පියගැට හතරකින් යුතු පියගැටපෙළ සඳහා මකර රුව සහිත කොරවක්ගල් දෙකක් ද සම්බන්ධකර තිබේ. මෙහි ශෛලමය උළුවස්සේ කොටස් සියල්ලම පාහේ නිරුපද්‍රිතව හමු වී ඇති හෙයින් සංරක්ෂණයේ දී නැවත පිහිටුවා ඉදිරිපස බිත්තිය ද ගඩොලින් සංරක්ෂණය කර තිබේ. සමස්ත ගොඩනැගිල්ලම පිහිටුවා ඇත්තේ ශෛලමය බොරදමක් සහිත පාදමක් මත ය. මණ්ඩපයකින් සහ ගර්භ ගෘහයකින් යුතු මෙම ගොඩනැගිල්ලේ මණ්ඩපයට අයත් කවුළු අතරින් එක් කවුළුවක් සංරක්ෂණයේ දී පිහිටුවා ඇති අතර අනෙක් කවුළුවට අයත් කොටස් අස්ථානගත වී ඇත. ගර්භ ගෘහය තුළ තනි කළු ගලින් කළ ආයත චතුරස්‍රාකාර හැඩයේ ආසනයක් තැන්පත්කර තිබේ. බොරදම් සහ කුළුණු කැටයම් යෙදූ එම ආසනයට ඉදිරියෙන් මල් ආසනයක පාදමක් සහ පද්මපීඨයක් සංරක්ෂණයේ දී තැන්පත් කර ඇත. එම ප්‍රධාන ආසනයට දෙපසින් ආයත චතුරස්‍රාකාර හැඩයේ තවත් ආසන ද්විත්වයකි. බැතිමතුන්ට ආසන වටා ප්‍රදක්ෂිණා කරමින් වන්දනාමාන කළ හැකි ලෙස මෙම ආසන පිහිටුවා ඇති හෙයින් අභයගිරිය තුළ නිරන්තර ජන ආකර්ශනයට ලක් වූ ප්‍රතිමාඝරයක් මෙහි පැවති බව තහවුරු වේ.




3. ධාරණී ගෘහය

අභයගිරි ස්තූපයට ගිණිකොන දෙසින් ස්ථාපිත ධාරණී ගෘහය (අංක:3) අභයගිරියේ ඇති ප්‍රධානතම මහායාන ඉදිකිරීමකි. මහායාන

ස්තූප සම්ප්‍රදායන් අනුව යමින් ආයත චතුරස්‍රාකාර හැඩයට නිමවා ඇති මෙය සංරක්ෂණයේ දී මීටර් 3ක් පමණ උසට බැඳ තිබේ. ඒ වෙත ප්‍රවේශ වීම උදෙසා නැගෙනහිරින් සහ බටහිරින් පියගැටපෙළ පිහිටුවා තිබේ. නැගෙනහිර පසින් වන පියගැටපෙළ කැටයම් රහිත සරල සඳකඩපහණකින් සහ පියගැට දාහතරකින් ද, බටහිර පසින් පිහිටි පියගැටපෙළ පියගැට දහසයකින් ද යුක්තය. ආයත චතුරස්‍රාකාර හැඩයේ පටු මතුපිටකින් යුතු මෙම ධාරණී ගෘහයේ මතුපිට කොටසෙහි මධ්‍යය උස්ව ද දෙපසින් ඊට තරමක් පහත් ලෙස ද ආයත චතුරස්‍රාකාර කොටස් පිහිටුවා ඇත. මහායාන රටවල දක්නට ඇති ගෘහනිර්මාණ සම්ප්‍රදාය අනුව යමින් මාලක වශයෙන් කරවා ඇතැයි සැළකිය හැකි මෙම ධාරණී ගෘහයේ කැණීම් මගින් සංස්කෘත අක්ෂරයෙන් ලියැවුණු ආරක්ෂක මන්ත්‍ර සහිත ගල් පුවරු දොළහක් හඳුනාගෙන ඇත. ආරක්ෂක මන්ත්‍ර ලෙස සංක්ෂිප්ත කරගත් මහායාන සූත්‍ර කොටස් සහිත මෙම ස්ථානය අභයගිරියට පැමිණි මහායානිකයින් විසින් ලෞකික සුබවිහරණය පතා වැඳුම් පිදුම් කළ ස්ථානයක් වශයෙන් පෙන්වා දිය හැකි ය.



4. අභිෂේක මණ්ඩපය



4. කළස් පිහිටුවීමට කළ සිදුරු

සිව්වැනිව අපගේ අධ්‍යයනයට පාත්‍ර වූයේ අභයගිරි ස්තූපයේ දකුණු දොරටුව ආසන්නයේ පිහිටුවා ඇති බුදු පිළිම සහ බෝධිසත්ත්ව පිළිම අභිෂේක ගැන්වීම පිණිස භාවිත කළ අභිෂේක මණ්ඩපය යි.(අංකː4) උතුරු දිශාවට මුහුණලා පිහිටි එහි ද්වාරයෙහි කැටයම් රහිත මුරගල් යුගලයක්, ජ්‍යාමිතික හැඩතල ඇති කොරවක්ගල් යුගලයක් සහ පියගැට තුනක් ශේෂ වී පවතී. එම ද්වාරයෙන් පිවිසෙනුයේ ගල් පුවරු අතුරා ඇති කුටියකට ය. එම කුටිය දෙපසින් තවත් කුටි ද්විත්වයකි. එම කුටි ද්විත්වයෙහිම ශෛලමය ආසනයක් ද,

ආසනය පාමුල සිදුරු හයක් ද දක්නට හැකි වේ. එසේ සිදුරු හයක් පිහිටුවා ඇත්තේ බුද්ධාභිෂේකය පිණිස කළස් සයකින් පැන් ගන්නා බැවින් එම බඳුන් තැන්පත් කිරීමට විය යුතුය. (කුලතුංග, 2014, 170) එසේ අභිෂේක ගන්වන ජලය ගොඩනැගිල්ලෙන් පිට කිරීම පිණිස ගොඩනැගිල්ල වටාම ගමන් කරන කාණුවක් කරවා තිබේ.

මහායාන සම්ප්‍රදායට පමණක් නොව දේශපාලන සංස්ථාවට ද ඉමහත් බලපෑමක් සිදු කළ දන්ත ධාතුව තැන්පත් කරන ලද ධාතු මන්දිරය (අංකඃ5) අභයගිරි ස්තූපයට නිරිතදිග දිශාවෙන් උත්තරමූල පරිශ්‍රය තුළ ස්ථාපිත කර තිබේ. නැගෙනහිර දිශාවට මුහුණලා ඇති එහි ප්‍රවේශ ද්වාරයට අයත් සඳකඩපහණ කැටයම් කිරීම පිණිස රේඛාවන් ඇඳ ඇතත් කැටයම් යෙදීමට නොහැකි වී ඇත. ගැඹුරට නෙළා ඇති නාගරාජ මුරගල් ද්විත්වයෙහි නාග පෙන හතකි. නා රජු අත රැඳි පුන්කලස මුරගලෙන් ඉදිරියට නෙරා විත් පවතින අතර රජුගේ ජටා මකුටය ද සියුම් මෝස්තරවලින් යුක්ත වේ. නා රජුට දෙපසින් සිටින තරබාරු වාමනයින්ගෙන් එක් අයෙක් අග්ගලා වැනි කැවිලි සහිත භාජනයක් ද, එක් අයෙක් නෙළුම් මලක් ද ගෙන සිටියි. මුරගලෙහි පැති පාර්ශවයෙහි කුළුණක් මත දණ ගසා සිටින හස්තියෙකුගේ රූපයක් නෙළා ඇත. සියුම්ව කැටයම් කරන ලද මකර රුව සහිත කොරවක්ගල් යුගලයකින් ද, පියගැට පහකින් ද සමන්විත මෙහි ඉහළින්ම ඇති වේදිකා ගලෙහි සිරස් තීරය මත වාමන රූප කැටයම් කර තිබේ. ඒ මත පුන්කලස් පිහිටුවීම සඳහා කරවී යැයි අනුමාන කළ හැකි චතුරස්‍රාකාර පාදම් යුගලයක් ද දක්නට ඇත. මෙම ද්වාරය කිසියම් අවස්ථාවක විනාශ කිරීමට උත්සහ දරා ඇති බව නිරීක්ෂණය කළ හැකි අතර සඳකඩපහණෙහි කැටයම් නෙළා නොමැති වීමට හෝ එහි පිහිටුවන්නට ඇති සඳකඩපහණ අස්ථානගත වීමට එය හේතුවක් වන්නට ඇත. පෙර සඳහන් කළ පුන්කලස් පිහිටුවීම සඳහා කළ චතුරස්‍රයට අයත් ශෛලමය පුන්කලසක් ගොඩනැගිල්ල ආසන්නයේම පතිතව ඇති අතර එහි නෙළුම් මලක් සියුම්ව කැටයම් කර තිබේ. වේදිකාවේ සිට දෙපසට බැස යාම පිණිස ද පියගැටපෙළ පිහිටුවා තිබී ඇතත් ඒවායෙහි සාධක දක්නට නොලැබෙන හෙයින් සංරක්ෂණයේ දී ගඩොලින් පියගැට නිමවා තිබේ. එම පියගැටපෙළ යොමු වී ඇත්තේ ධාතු මන්දිරය වටා ප්‍රදක්ෂිණා කළ හැකි පටු පෙත්මගක් වෙතට ය. පෙත්මග ඔස්සේ ගමන්කරන විට ධාතු මන්දිරයේ අලංකාර

බොරදම් සහිත ශෛලමය පාදම සමීපව නිරීක්ෂණය කළ හැකි වේ. එම බොරදම් තීරු අතර එක් තීරුවක් පනේල වශයෙන් බෙදා සිංහ රූප සහ වාමන රූප අලංකාරව කැටයම් කර ඇති හෙයින් මෙම ධාතු මන්දිරයට අභිමානවත් බවක් එක් වී තිබේ. එක් අතක් ඔසවාගෙන පසෙකට හැරී සිටින සිංහයින්, ගර්ජනා කරමිනි ඉදිරිය බලා හිඳින සිංහයින් මෙන්ම හිඳගෙන සිටින සිංහයින් එකිනෙකට වෙනස් ලෙස කැටයම්කර ඇති අතර සිංහයින්ගේ කේෂර සහ වල්ගය නිදහස් සහ රිද්මයානුකූලව විහිදී යන අයුරින් කැටයම් කර තිබීමෙන් සජීවි බවක් එක් වී ඇත.



5. ධාතු මන්දිරය



5. වාමන රූව



5. සිංහ රූව



5. සිංහ රූව



5: වාමන රූව

එකක් හැර එකක් වශයෙන් සිංහ රූප සහ මානව රූප කැටයම් කර ඇති මෙහි දෑත් ඉහළට ඔසවා දිව යන වාමන රූප කිහිපයකි. ඉදිරියට එල්ලා වැටෙන කුස සහිත තරබාරු ශරීරයකින් යුතු වාමනයා මාල, වළලු කර්ණාභරණ සහ පූන නූල යන ආභරණවලින් සහ ධෝතියකින් සැරසී සිටියි. නර්තනීය ඉරියව්වකින් දක්වා ඇති තවත් වාමන රුවක එම වාමනයා නෙළුමක් වැනි යමක් අතින් දරාගෙන පාද ඔසවා රිද්මයානුකූලව සිටින අතර නර්තනයේ ස්වභාවයට අනුව උතුරු සළුව ද ඉහලට විහිදී ගොස් තිබේ. ආභරණවලින් සැරසී හිඳින මෙම වාමනයින් ක්‍රියාශීලී සහ රිද්මීය ඉරියව්වලින් දක්නට හැකි වේ. සෑම පනේලයක්ම එකින් එක වෙන් කරමින් කුඩා ලියවැල් තීරුවක් යොදා ඇති අතර සමස්තයක් වශයෙන් ගත් විට ධාතු මන්දිරයට ගාම්භීර බවක් එක් කිරීමට මෙම කැටයම් සහිත බොරදම් තීරුව ඉහළ දායකත්වයක් දක්වා ඇති බව හඳුනාගත හැකිය. ධාතු මන්දිරයේ ගර්භයට ප්‍රවේශ වීම පිණිස උළුවස්සක් පිහිටුවා තිබේ. ධාතු මන්දිරය ගල් කණු 6×6 ප්‍රමාණයේ ගොඩනැගිල්ලක් වන අතර අලංකාර කුළුණු හිස් සහිත කණු තිස් එකක් දැනට දක්නට හැකි වේ. එම කුළුණු හිස් නර්තනීය ඉරියව්වෙන් යුතු වාමන රූපවලින් සහ පළාපෙති මෝස්තරයන්ගෙන් අලංකාර කර ඇත. ගර්භයේ නිරිතදිග කෙළවරට වන්නට සෝපානයකට අයත් යැයි අනුමාන කළ හැකි ගල් පුවරුවක් දක්නට හැකි අතර එහි ද වාමන රූප කැටයම්කර තිබේ. පංචාවාස පරිශ්‍රයක් මධ්‍යයෙහි ආරක්ෂිතව ඉදිකර ඇති මෙය අභයගිරි පරිශ්‍රයෙහි පැවති ජනතා ආකර්ශනය දිනාගත් වටිනා ස්ථානයක් වූ බවට මෙම ඉදිකිරීම් අංගෝපාංග තුළින් නිගමනය කළ හැකි වේ.



6. මහායාන ස්තූපය

අභයගිරියට අයත් මහායාන ස්තූපය (අංකඃ6) මෙම අධ්‍යයනයේ දී ඉතාම වැදගත් වූවකි. ආරක්ෂිත ප්‍රාකාරයකින් යුක්ත

මෙම පරිශ්‍රය වෙත ප්‍රවේශ වීමට බටහිර දිශාවට මුහුණලා කැටයම් රහිත සරල සඳකඩපහණක්, පියගැට හතරක් සහ දොරගලක් සහිත ප්‍රවේශ ද්වාරයක් සංරක්ෂණය කර තිබේ. එයින් පිවිසෙන තරමක් උස් මළුව තුළ ආයත චතුරස්‍රාකාර පාදමක් මත ඉහලට ගමන් කරන විට ඇතුල් පසට ආනත වන මහායාන ස්තූපය නිර්මාණය කර තිබේ. ස්තූපය මතට ප්‍රවේශ වීම පිණිස බටහිර දිශාවට මුහුණලා පියගැටපෙළක් පවතින අතර රේඛා පමණක් දක්වූ සඳකඩපහණක් සහ පියගැට හතක් පිහිටුවා ඇත. එයින් ප්‍රවේශ වන්නේ පියස්සකින් ආවරණය වී පැවතිනැයි අනුමාන කළ හැකි කුඩා කුටියක් වෙතට ය. එම කුටියේ සිට උතුරු පසින් සහ දකුණු පසින් ස්තූපය ඉහළට ගමන් කිරීම උදෙසා පියගැටපෙළ දෙකක් පිහිටුවා ඇත. ඒවායෙහි පියගැට අට බැගින් හඳුනාගත හැකි වේ. ක්‍රි.ව.7-9 සියවස්වලට අයත්වන මහායාන යන්ත්‍ර පාඨ ලියා පැවති ඊයම් ඵලකයක් මෙයින් හමු වූ හෙයින් මෙය මහායාන ස්තූපයක් බව තහවුරු කරගෙන තිබේ.



7. අභිෂේක මණ්ඩපය

පෙර දක්වූ සිතියමෙහි අංකඃ7 යනුවෙන් නම්කර ඇත්තේ අප විසින් සාකච්ඡා කළ ආකාරයේම අභිෂේක මණ්ඩපයකි. උතුරු දිශාවට මුහුණලා පිහිටුවා ඇති එහි ද්වාරයෙහි ගැටය සහිත සරල මුරගල් යුගලයක් සහ ජ්‍යාමිතික හැඩයෙන් යුතු විමාන ලක්ෂණ සහිත සරල කොරවක්ගල් යුගලයක් දක්නට ඇති අතර එයින් එක් මුරගලකට හානි වී ඇත. ගොඩනැගිල්ලේ ශෛලමය පාදම වටා කාණුවක් බැඳ අභිෂේක මණ්ඩපයෙන් ඉවත් කරන ජලය ගලා යෑමට පහසුකම් සළසා ඇති අතර එම දිය අගල සඳහා ද කළුගල් පුවරු භාවිත කර තිබේ. ගල් කණු 4×2 ප්‍රමාණයේ ගොඩනැගිල්ලක් වන්නට ඇතැයි අනුමාන කළ හැකි මෙහි ගල් කණුවලින් පිටත වේදිකාවක් ලෙස නිමවමින්

ගල් පුවරු අතුරා තිබේ. බුදු පිළිම හෝ බෝසත් පිළිම අභිෂේක ගැන්වීම පිණිස මෙය භාවිත කරන්නට ඇති බව පුරාවිද්‍යාඥයින් විසින් අනුමාන කර ඇත.



8. ප්‍රාසාදය

අභිෂේක මණ්ඩපයට තරමක් උතුරු දෙසින් ස්ථාපිත ප්‍රාසාදය (අංකඃ8) ස්වභාවික ගල් කුළක් පදනම් කරගනිමින් නිර්මාණය කරන ලද්දකි. මහල් ගොඩලැගිල්ලක් වන මෙහි ද්වාරය නැගෙනහිර දිශාවට මුහුණලා ඇති එහි ප්‍රවේශ ද්වාරයෙහි කැටයම් රහිත සරල සඳකඩපහණක් සහ පෙන පහක් සහිත නාග රාජ මුරගලක් පවතින අතර අනෙක් මුරගල අස්ථානගත වී තිබේ. මකර රුව සහිත කොරවක්ගල් යුගලය ද අප එහි අධ්‍යයනයේ යෙදෙන විට බිම පතිත වී තිබුණි ඇතුළු ගෘහයට ගමන් කිරීම පිණිස ගල් ඇතිරුමක් යොදා ඇති අතර එයින් පිවිසෙනුයේ ගල් කණු 4×3 ප්‍රමාණයේ වූ කුටියකටයි. එම කුටියෙහි වම් පස සහ දකුණු පසින් තරමක් උස්ව කුඩා කුටි යුගලයක් නිමවා ඇති අතර ඒ වෙත ප්‍රවේශ වීමට පියගැටය බැගින් පිහිටුවා තිබේ. මෙම බිම් මහලට අයත් ගල් කණු පහක් නිරුපද්‍රිතව හඳුනාගත හැකි වේ. ගල් කුළ මත ඉදිකර ඇති ඉහළ මහල වෙත ප්‍රවේශ වීම පිණිස පෙර සාකච්ඡා කළ කුටි වලට පිටතින් ඊට දකුණු පසින් පියගැටපෙළක් පිහිටුවා තිබේ. දොරගලක් සහ පියගැට එකොළහකින් යුතු එයින් ප්‍රවේශ වන ඉහළ මහලෙහි ගඩොල් බිත්ති කොටස් ශේෂ වී ඇති අතර මෙය පොළොන්නරුවේ සත්මහල් ප්‍රාසාදයට සමානව පවතින්නට ඇතැයි අනුමාන කරයි.



9. ස්තූප මළුව

අභයගිරි පුරාවිද්‍යා පරිශ්‍රයට අයත් මහායාන සාධක හමු වූ තවත් එක් වාස්තු විද්‍යා ඉදිකිරීමක් වශයෙන් සුදස්සන පධානඝර භූමියෙහි පිහිටි කුඩා ස්තූපයක් (අංකඃ9) හඳුනාගත හැකිය. සුදස්සන පධානඝරය සහිත දීඝපාෂාණයෙහි පිහිටි කුඩා කඳුගැටයක් මත මෙම ස්තූපය පිහිටුවා ඇති අතර එයට ප්‍රවේශ වීම පිණිස කඳුගැටයේ දකුණු දිශාවේ සිට පියගැටපෙළක් නිමවා තිබේ. සංරක්ෂණයට බඳුන්කර නොමැති මෙම ස්ථානය අප ක්ෂේත්‍ර අධ්‍යයනය කරන විටත් කටු පඳුරු ගහණය හේතුවෙන් තරමක් ව්‍යාකූලව පැවතිනි. ස්තූප මළුව නිර්මාණය කිරිම සඳහා කඳු ගැටය සහ දීඝ පාෂාණය පදනම් කරගනිමින් ශෛලමය බැම්මක් නිර්මාණය කර ඇත. ස්තූපය සහිත කොටසෙහි ශෛලමය මල් ආසන ද්විත්වයක් නිරීක්ෂණය කළ හැකි විය. මෙහිදී විශේෂයෙන්ම සඳහන්කළ යුත්තේ අප එහි ගමන් කරන විටත් ස්තූප ගර්භය සහිත කොටස නිධන් හොරුන්ගේ ග්‍රහණයට ලක් වී අවිධිමත් ලෙස හාරා දැමූ වළකින් යුක්ත වූ බවය.

මෙසේ අභයගිරි විහාර පරිශ්‍රයෙහි ස්ථාපිත මහායානික වාස්තු විද්‍යා ඉදිකිරීම් හී වත්මන් තත්ත්වය හඳුනාගත හැකි අතර ඒවා මත පදනම් වූ මහායානික සංකල්ප මොනවාද යන්න වෙන් වෙන්ව විග්‍රහ කරගත යුතු වේ. මහායානික බෝධිසත්ත්ව ප්‍රතිමාගෘහ ද්විත්වයක් (අංකඃ 1 සහ 2) පරිශ්‍රය තුළින් අධ්‍යයනය කළ හැකි වීම තුළින් මහායානික බෝධිසත්ත්ව වන්දනයේ බලපෑම අභයගිරියෙහි පැවති බව තහවුරු වේ. ධාතුසේන රජු විසින් මහබෝගෙය ආසන්නයේ විසිතුරු මෛත්‍රී බෝධිසත්ත්ව ප්‍රතිමාවට ආභරණ කරවූ බව මහාවංසය විසින් තහවුරු කරයි. (මහාවංසය, 2007, 38, 67, 178) සෑම පුද්ගලයෙකුගේ පරම අපේක්ෂාව විය යුත්තේ බුද්ධත්වයට පත් වීම බවත්, ඒ සඳහා

බෝධිසත්ත්ව චර්යාවෙහි නියැළිය යුතු බවත් මහායානිකයන් විශ්වාස කරන අතර ඒ සඳහා වන්දන, පූජන වැනි අනුත්තර පූජාවන් හී නිරත විය යුතු බව කියැවේ. (සාසනරතන හිමි, 2012. 205) ඒ අනුව බෝධිචිත්තය උපදවා ගැනීම පිණිස කාලාත්‍රයේ බුදුවරුන්ට සහ බෝධිසත්ත්වයින්ට වන්දනාමාන කිරීම මහායානිකයන් විසින් අනුමත කර ඇත. එහිදී ශ්‍රී ලංකාවෙහි වඩාත් ප්‍රසිද්ධත්වයට පත් වූයේ මෛත්‍රී, වජ්‍රපාණී, අවලෝකිතේශ්වර, මංජු ශ්‍රී ආදී බෝධිසත්ත්වයින් ය. තන්ත්‍රයානයෙහි එන ක්‍රියාතන්ත්‍රය මගින් පූජනීය ස්ථානවල ස්තෝත්‍ර කීම අනුමත කරන අතර ආදිකර්මික බෝධිසත්ත්වයින් උදෙසා කළ යුතු ආගමික ක්‍රියාවන් ද පෙන්වා දී තිබේ. ලෝකඩ අවලෝකිතේෂ්වර ප්‍රතිමාවක් සහ තාරා දෙවඟනගේ ප්‍රතිමාවක් ද, කිරිගරුඬ මාධ්‍යයෙන් කරවූ හිස සුන් තාරා දෙවඟනගේ ප්‍රතිමාවක් ද අභයගිරිභූමියෙන් හමු වී ඇති අතර අමිතාභ බුදුන්, අවලෝකිතේෂ්වර බෝසතුන් සහ මහා ස්ථාමප්‍රාප්ත බෝසතුන්ගේ රූප කැටයම් කළ එලකයක් ද අභයගිරි කැණීම්වලින් හමු වී තිබේ. (කුලතුංග, 2014, 294) අභයගිරි ස්තූප ප්‍රතිසංස්කරණයේ දී එහි ගර්භය ආසන්නයේ තැන්පත්කර තිබී හමු වූ පෙර සඳහන් කළ කිරිගරුඬ මාධ්‍ය කැටයම් එලකයෙහි අමිතාභ බුදුන් විතර්ක මුද්‍රාවෙන් ද, අවලෝකිතේෂ්වර බෝසතුන් අමෘත කළසක් දරා සිටින ආකාරයෙන්ද කැටයම් කර තිබේ. (කුලතුංග, 2014, 307) අභයගිරි පුරාවිද්‍යා කෞතුකාගාරයෙහි මෙවන් බෝධිසත්ත්ව ප්‍රතිමා, තාරා දෙවඟන ප්‍රතිමා, මහායානික ලක්ෂණ සහිත බුද්ධ ප්‍රතිමා පමණක් නොව ස්වස්තිකය, හක්ගෙඩිය, භද්‍ර පීඨය, චාමරය, පුන්කලස, අංකුසය, බෝධිය සහ මහාමේරුව යන අෂ්ට මංගල සළකුණු නිර්මාණ ද ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය. අභයගිරියේ නේවාසික ශිෂ්‍යයෙකු වශයෙන් වැඩවාසය කළ පාහියං භික්ෂුව ද තම දේශාටන වාර්තාව තුළ අනුරාධපුරයේ රජු බුදු හිමිගේ බෝධිසත්ත්ව අවධිය නිරූපණය කරන චිත්‍ර කතා ඇඳ ඒවා මග දෙපස ප්‍රදර්ශනය කළ බව කියැවේ. (ෆාහියන්ගේ දේශාටන වාර්තාව, 2017, 98) පසුකාලීනව ලියැවුණු සාහිත්‍ය මූලාශ්‍රයන් තුළ ද භික්ෂූන් බුද්ධත්වය අපේක්ෂා කළ අවස්ථා (පූජාවලිය, 1953, 46) හමුවන අතර සෙල්ලිපි කිහිපයකින්ම තමන්ව බෝධිසත්ත්වයින් ලෙස හඳුන්වා දුන් පාලකයන් පිළිබඳ සාධක හමු වේ. (රණවැල්ල, 2004, 233-234) මෙම මූලාශ්‍රගත තොරතුරු සහ පුරාවස්තූන් සමග

අභයගිරියෙන් හමුවන වාස්තු විද්‍යා ඉදිකිරීම් ද සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමේ දී ශ්‍රී ලාංකේය බෝධිසත්ත්ව වන්දනාවේ ආරම්භය අභයගිරියේ සිදුව ඇති බවත්, බෝධිසත්ත්වයින් වන්දනා කිරීම පිණිස ඊට වෙන්කළ ගෘහයන් කරවා, ඒවායෙහි බෝසත් ප්‍රතිමා තැන්පත් කර ඇති බවත්, ස්තූපයන්හී නිධන් වස්තූන් වශයෙන් බෝසත් ප්‍රතිමා තැන්පත් කර ඇති බවත් තහවුරු කළ හැකි වේ. ආදිකර්මික බෝධිසත්ත්වයින් වන්දනා කිරීම පමණක් නොව තම තමන්ගේ විමුක්තිය උදෙසා බෝධි චිත්තය උපදවා ගැනීමට උපකාරී කරගැනීමට ද බෝධිසත්ත්ව වන්දනාව පුරාතනයින් විසින් භාවිත කරන්නට ඇත.

අභයගිරියෙන් හමුවන අභිෂේක මණ්ඩප ද්විත්වයක නටඹුන් (අංකඃ4 සහ 7) ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් හඳුනාගන්නා කරන ලද අතර මේවා භාවිත කරන්නට ඇත්තේ බුද්ධාභිෂේකයට හෝ බෝධිසත්ත්ව ප්‍රතිමා අභිෂේකයට ය. මහායාන දහමෙහි බුද්ධාභිෂේක මංගල්‍යය වශයෙන් හඳුන්වනුයේ බුදු පදවියට සුදුසු බෝධිසත්ත්වයෙකු එම තත්ත්වයට පත් වූ පසු බුදු කෙනෙකුන් විසින් පැන් කලස් හිස මතට වත් කිරීමෙන් අභිෂේක ගැන්වීමයි. (කුලතුංග, 2014, 169) බුද්ධාභිෂේකයේ දී කළස් හයක් යොදා ගන්නා බැවින් ෂට්කළසාභිෂේකය ලෙසින් හඳුන්වන අතර අප සාකච්ඡා කළ අංකඃ4 අභිෂේක මණ්ඩපයෙහි කළස් තැන්පත් කිරීමට සිදුරු හය බැගින් තනා තිබීමෙන් ඒ බව තහවුරු වේ. මෙම අභිෂේක මණ්ඩපය පිළිබඳ විග්‍රහයක් ගෙන එන චන්ද්‍රා වික්‍රමගමගේ මහතා ද එසේ කළස් හය බැගින් තැබීම පිණිස සිදුරු හයක් කරවා ඇති බවත් එම අභිෂේක මණ්ඩපය තුළ එක්වර පිළිම දෙකක් අභිෂේක කර ඇති බවත් දක්වයි. (කුලතුංග, 2014, 172) මේ ආශ්‍රිත කැණීම්වලින් විශාල ප්‍රමාණයේ මැටි මුට්ටිවල කොටස් හමු වීමෙන් ද මේ බව තහවුරු වේ. සාහිත්‍ය මූලාශ්‍ර ආශ්‍රය කරගැනීමේ දී ධාතුසේන රජු විසින් අලංකාර අභිෂේකයක් කරවූ බවත් අභිෂේක බුද්ධ බිම්බයට පළඳනා කරවූ බවත් මහාවංශයෙහි සඳහන් කරයි. (මහාවංසය, 2007, 38, 67, 178) තව ද පළමුවැනි කාශ්‍යප රජ සමයේ දී රජුගේ ඥාතියෙකු වූ මිගාර සෙනෙවියා විසින් අභිෂේක ජින සඳහා අභිෂේකයක් පැවැත්වීමට අවසර ඉල්ලා ඇතත් ඊට අවස්ථාව හිමි නොවූ බවත්, පළමුවැනි මුගලන් රාජ්‍ය සමයේ දී එම අපේක්ෂාව ඉටුකර ගැනීමට අවස්ථාව හිමි වූ බවත් සඳහන් කර ඇත. (මහාවංසය, 2007, 39, 40, 183) චන්ද්‍රා වික්‍රමගමගේ මහතාගේ මතය වන්නේ

අභිෂේක ජින යනු අභිෂේකය සඳහාම යොදා ගත් බුද්ධ ප්‍රතිමාව බවයි. සිව්වැනි මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපිවල ද "දාගෙයි බුද්බිසොවට් තෙල් ගන්නා ඉසා" (Ranawella. 2004, 275) යනුවෙන් ධාතු මන්දිරයෙහි පැවති බුද්ධාභිෂේකයක් පිළිබඳව සඳහන්කර තිබේ. බුද්ධන්නේහෙළ සෙල්ලිපිය අධ්‍යයනය කරන රණවීර ගුණවර්ධනයන් එහි එන "නාගිරියැ වැවූ හර්සෙයන් වහන්සේ වැළැඳූ අනන්තරයෙන් මෙකුන්වහන්සේ අභිෂේකයෙන්" (වික්‍රමසිංහ, 2000, 98-99) යනාදී වශයෙන් භික්ෂු අභිෂේකයක් පිළිබඳ කියැවෙන බවට සඳහන් කරයි. මහායානික මහා වෛරෝචන සූත්‍රයට අනුව ආචාර්යවරයෙකු විසින් තම ශිෂ්‍යයා අභිෂේක කළ යුතු අතර එය උදක අභිෂේකය ලෙසින් ද හඳුන්වයි. (කුලතුංග, 2014, 173) ඉන්දීය ආචාර්යවරයෙකු වූ රත්නාකර ශාන්ති හිමි පළමුවැනි සේන රජුගේ සමයේ දී මෙරටට පැමිණි බවත් උන්වහන්සේට ශිෂ්‍යයින් පන්සියයක් ඇති වූ බවත් තාරානාථ පඬිවරයා විසින් දැක්වීම තුළින් වික්‍රමශීලාවෙහි පැවති භික්ෂු අභිෂේකය උන්වහන්සේ විසින් අභයගිරියට ද හඳුන්වා දෙන්නට ඇතැයි අනුමාන කළ හැකිය. (කුලතුංග, 2014, 289-290) මේ අනුව විවිධ මතධාරීන්ට මනා තෝතැන්නක් වූ අභයගිරියෙහි බුද්ධාභිෂේකය, බෝධිසත්ත්ව අභිෂේකය මෙන්ම භික්ෂු අභිෂේකය ද පැවතෙන්නට ඇතැයි නිගමනය කළ හැකි අතර එය තහවුරු කර ගැනීම පිණිස මෙම පරිශ්‍රයෙන් හමුවන අභිෂේක මණ්ඩප හා ඒ ආශ්‍රිත පුරාවස්තූන් උපයෝගී කරගත හැකිය.

අභයගිරියේ ධාරණී ගෘහය(අංකː3), මහායාන ස්තූපය(අංකː6), සුදස්සන පධානඝරයේ සතූප(අංකː9) යන ස්ථානවලින් පමණක් නොව අභයගිරි ස්තූප ගර්භයෙන් පවා හමුවන මහායාන ධාරණී මන්ත්‍ර මෙම අධ්‍යයනයෙහිලා සුවිශේෂීම මූලාශ්‍රයන් වශයෙන් දැක්විය හැකිය. ධාරණී ගෘහය කැණීමට ලක් කළ පුරාවිද්‍යාඥ සෙනරත් පරණවිතානයන් විසින් නාගරී අකුරින් ලියූ ධාරණී ගල් පුවරු අටක් සොයාගෙන ඇති අතර එය දැනට අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයෙහි තැන්පත්කර තිබේ. නන්දසේන මුදියන්සේ මහතා විසින් තම Mahayana Monument in Ceylon කෘතියෙහි එම ධාරණී ලිපි පරිවර්තනය කරමින් එම ලිපි ක්‍රි.ව. නවවැනි සියවසට අයත් බවට (Schopen, 1982, 100-107) අදහස් දක්වන අතර පසුකාලීනව අභයගිරි ව්‍යාපෘතිය මගින් සිදුකළ කැණීම් මගින් ද එහි තිබී ධාරණී

ගල් දෙකක් හඳුනාගන්නා ලදි. (කුලතුංග, 2014, 167-168) වර්ෂ 2011 දී අභයගිරි ස්තූපය සංරක්ෂණයේ දී ද ස්තූප ගර්භ කොටසෙහි තැන්පත් කර තිබූ ගල් පුවරුවකින් ධාරණී මන්ත්‍රයක් හමු වූ අතර එය ක්‍රි.ව.8-10 සියවස්වලට අයත් වජ්‍රයානික ලිපියක් බව කියැවේ. (Chandawimala ,2016, 165) සුදස්සන පධානඝරයට අයත් කුඩා ස්තූප පරිශ්‍රයෙන් (අංකඃ9) ද නාගරී අක්ෂරයෙන් ලියා තිබූ ධාරණී මන්ත්‍රයක් හමු වී ඇති අතර මහායාන ස්තූපයේ (අංකඃ6) කැණීමකින් ද හි පිටත ප්‍රාකාරයෙහි තැන්පත්කර තිබූ ක්‍රි.ව.7-9 සියවස්වලට අයත් මහායාන මන්ත්‍ර සහිත ඊයම් තහඩුවක් හමු විය. (කුලතුංග, 2014, 292-295/311) මෙම ධාරණී යන්නෙහි අර්ථය වන්නේ දැරීම සහ ඉසිලීම සහ දරා සිටීමයි. මහායාන සූත්‍ර කෙටිකර ආරක්ෂක මන්ත්‍ර වශයෙන් භාවිත කර ඇති අතර විවිධ මන්ත්‍ර විවිධ අරමුණුවලට අනුව සකසාගෙන ඇත. උදාහරණ වශයෙන් සතුරු භය සඳහා රත්නෝල්කා සූත්‍රය ද, වැසි අපේක්ෂා කරමින් මේඝ සූත්‍රය ද, පව් සිදුවීම වළක්වා ගැනීම වෙනුවෙන් මහා ප්‍රතිසාරා සූත්‍රය ද, අමනුෂ්‍ය උවදුරුවලින් මිදීම පිණිස මහා සහස්‍ර මර්දිනී සූත්‍රය ද, නයි විෂෙන් ආරක්ෂා වීමට මහා මයුරී සූත්‍රය ද, වන සතුන්ගෙන් ආරක්ෂා වීමට මහා ශීතවතී සූත්‍රය ද භාවිත කළ මහායානිකයන් බෝ වන රෝගවලින් ආරක්ෂා වීම පිණිස මහාරක්ෂා මන්ත්‍රානුසාරිණී සූත්‍රය ද ධාරණී ලෙස භාවිත කර තිබේ. (සාරානන්ද හිමි, 2014, 332-333) චීනය, ටිබෙට් සහ නේපාල ආදී වූ රටවල මෙම ධාරණී බහුලව භාවිත කර ඇති අතර ජපානයට ධාරණී හඳුන්වා දුන් කොබෝ දයිෂි හිමි මන්ත්‍ර සහ යන්ත්‍ර තුළින් විශ්වබලය පුද්ගලයාට හිමිවන බව ප්‍රකාශ කර ඇත. කෙසේ වුව මෙම ධාරණී ප්‍රමුඛ කොටගත් බලපෑම ථෙරවාදීන් වෙත ද එල්ල වී ඇත. ථෙරවාදීන්ගේ ගිහි පිරිත තුළ ධාරණී යන වචනය පවා අඩංගු වන අතර මහායානිකයන්ගේ රතන යන්ත්‍රය ථෙරවාදීන් රතන සූත්‍රය ලෙස ද, අභිසම්භිධාන යන්ත්‍රය අභිසම්භිදා පිරිත වශයෙන් ද, සීවලී යන්ත්‍රය සීවලී පිරිත වශයෙන් ද, ජලනන්දන යන්ත්‍රය ජලනන්දන පිරිත වශයෙන් ද භාවිත කර ඇත. (Chandawimala, 2016, 197-198) තව ද ආටානාටිය සූත්‍රය, ඇණවුම් පිරිත, ඛුද්දක ජින පංජරය, මහාසමය, බන්ද පිරිත, සූරිය පිරිත සහ මෝර පිරිත ද ථෙරවාදීන් හට හිමි වී ඇත්තේ මහායානිකයන්ගේ ධාරණී මන්ත්‍ර බලපෑමෙනි. (මහින්ද හිමි, 2018, 112) මහාවංශගත සාධක අනුව සිව්වැනි අග්බෝ

රජුගේ කාලයෙහි පළමු වරට පරිත්‍රාණ ධර්මදේශනාවක් සිදුකළ බවත්, දෙවැනි සේන රජු මහා පිරිත් උළෙලක් පවත්වා රතන සූත්‍රය රන් පත් ඉරුවල ලියැවූ බවත්, පොළොන්නරුවේ රාජත්වයට පත් පළමුවැනි පරාක්‍රමබාහු රජු විසින් ධාරණීසරයක් කරවා ඇති බවත් තහවුරු කරගත හැකිය. (මහාවංසය, 2007, 44, 6, 204) මෙම ධාරණී තුළින් ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ වෙනත් රාජ්‍යයන් අතර පැවති සබඳතා ද තහවුරු කරගත හැකි වේ. උදාහරණය වශයෙන් ක්‍රි.ව. තෙවැනි සියවසේ පටන් අමෝඝවජ්‍ර භික්ෂුව යටතේ චීනයේ ධාරණී මන්ත්‍ර භාවිතය පැතිරුණු අතර කොබෝ දයිෂි හිමි විසින් ජපානයට ධාරණී හඳුන්වා දී ඇත. (කුලතුංග, 2014, 292-293) අභයගිරියෙන් හමු වූ ධාරණී ද චීන ධාරණී සමග සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමෙන් ඒවායෙහි සමානතා මෙන්ම අසමානතා ද හඳුනාගෙන තිබේ. ක්‍රි.ව. 7-8 ශතවර්ෂ සමයෙහි ඉන්දියාවේ ඔරිස්සා ප්‍රදේශය ආශ්‍රිත කාලිංග දේශයත් සමඟ ශ්‍රී ලංකාව සබඳතා පවත්වා ඇති අතර එම ප්‍රදේශයෙන් හමුවන ටෙරාකොටා පුවරුවල ලියා ඇති ධාරණී මන්ත්‍ර තුළින් එම සබඳතා තවදුරටත් තහවුරු කරයි. (Mishra. 2016, 74-80) ජාවා හී රතු බෝකෝ ආරාම සංකීර්ණයෙන් හමුවන ධාරණී මන්ත්‍ර සහ අභයගිරි භික්ෂූණ් සම්බන්ධව එහි ඇති සෙල්ලිපි සාධක අනුව දෙරට අතර පැවති මහායානික සම්බන්ධතා හඳුනාගත හැකි වේ. (Mishra, 2015, 741-747)

අභයගිරි විහාරවාසීන් ජනප්‍රිය බුදු දහම හඳුන්වා දීමෙහිලා උත්සුක වූ බැවින් ම ජනතා ආකර්ශනය දිනාගත හැකි බොහෝ වස්තූන් තමන් සතුකරගෙන ඇත. අලංකාර පිළිම, ප්‍රාසාද, ස්තූප, බෝධිඝර ආදිය තැනවීමෙන් ද, ලෞකිකමය පුද පූජාවන්හී නිතර වීම තුළින් ද මහජනයාගේ සිත් සතන් දිනා ගැනීමට සමත් වී තිබේ. අප සාකච්ඡා කළ ධාතු මන්දිරය එහි වැදගත්ම අවස්ථාවකි. කීර්ති ශ්‍රී මේඝවර්ණ රාජ්‍ය සමයේ දී මෙරටට රැගෙන එන දන්ත ධාතුව තම විහාරස්ථානයේ ප්‍රදර්ශන භාණ්ඩයක් වශයෙන් තැන්පත් කිරීම එහිදී සිදුකර ඇත. පාහියං හිමිගේ දේශාටන වාර්තාව මගින් තහවුරු කරන පරිදි දළඳා මන්දිරයේ පවතින දන්ත ධාතුව පෙරහැරක් මගින් අභයගිරියේ ධාතු ප්‍රදර්ශන ශාලාවට රැගෙන ගොස් දින අනූවක් එහි තබා පුද පූජා පවත්වයි. (ෆාහියන්ගේ දේශාටන වාර්තාව, 2017, 98) ඒ අනුව එම දින අනූව පුරාම මහජනතාව වෙනුවෙන් අභයගිරි ධාතු

මන්දිරය විවෘතව තිබී ඇති අතර ශ්‍රද්ධාවත් බෞද්ධයින් ඈත ගම් දනව්වලින් පවා පැමිණෙන්නට ඇති අතර පාහියං වැනි විදේශීය භික්ෂූණ් ද මෙම වාර්ෂික පුණ්‍යෝත්සවය සඳහා සහභාගී වන්නට ඇත. අප සාකච්ඡා කළ ධාතු මන්දිරය ද එතරම් අලංකාර කැටයමින් යුතුව ගාම්භීර ස්වරූපයකින් නිමවා තිබෙන්නට ඇත්තේ එබැවිනි. ලෝකෝත්තර සුවය පතා මහාවිහාරිකයින් ඒකාකාරී වන්දනා ක්‍රම අනුගමනය කිරීමට සමකාලීනව මෙවන් විචිත්‍ර උත්සව සහ වන්දනා ක්‍රම පැවැත්වීම ඔස්සේ අභයගිරිවාසීන් උපක්‍රමශීලීව මහජන ආකර්ශනය දිනා ගන්නට ඇත.

මෙතෙක් සාකච්ඡා කළ මහායානික ඉදිකිරීම්වලට අමතරව අප ක්ෂේත්‍ර ගවේෂණය තුළින් උත්තර මූලයට අයත් ගොඩනැගිලි නටබුන් අතර අෂ්ටාශ්‍රාකාර හැඩයේ (අටපට්ටම්) ගොඩනැගිලි පාදම් ද හඳුනාගත හැකි විය. ගඩොලින් සංරක්ෂණය කර තිබූ එම කුඩා ගොඩනැගිලි විශේෂය භික්ෂූණ් ධාරණී මන්ත්‍ර හෝ සූත්‍ර සජ්ඣායනා කිරීම පිණිස මණ්ඩප වශයෙන් අනුමාන කිරීමට ද හැකියාව ඇත. නමුත් එහි උපයෝගීතාවය නිශ්චිතව සඳහන් කිරීම අපහසු වේ. අභයගිරියෙහි ආසනඝරය ලෙසින් නම්කර ඇති බෝධිඝරය ද මෙහිදී වැදගත් වේ. බෝධිඝරයක් ලෙස භාවිත කළ ද එහි විශාල ප්‍රමාණයේ වජ්‍රාසනයක්, කුඩා ආසන හා සිරිපතුල්ගල් කිහිපයක් දැකගත හැකි වේ. මෙය ද මහායානිකයන්ගේ ආකර්ශණීය වන්දනා ස්ථානයක් වන්නට ඇතැයි අනුමාන කළ හැකි වන්නේ සරල බෝධිඝර ලක්ෂණ ඉක්මවා යමින් එහි ඇති අලංකාරත්වය හෙයිනි. අභයගිරි ස්තූපයේ ගර්භය සංරක්ෂණයේ දී ද ධාරණී මන්ත්‍ර සහ බෝධිසත්ත්ව ප්‍රතිමා හමුවීමෙන් පසුකාලීනව ස්තූපය ප්‍රතිසංස්කරණය කළ රජවරුන් ද මහායාන බලපෑමට ලක්ව ඇති බව තහවුරු වේ.

**නිගමනය**

අනුරාධපුර අවධියෙහි සිදුවූ හීනයාන-මහායාන නිකාය භේදය මූලික කරගනිමින් අභයගිරි විහාර සංකීර්ණය මහායාන, ථෙරවාද, වජ්‍රයාන ආදී වූ බොහෝ මතවාදයන්ට විවෘත ස්ථානයක් වශයෙන් සංවර්ධනය වන අතර එහි වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් පවා පදනම් වන්නේ එම විවෘත මතවාදයන්ට අනුකූලව ය. ඒ අනුව ධාරණී ගෘහ,

බෝධිසත්ත්ව ප්‍රතිමාගෘහ, මහායාන ස්තූප, අභිෂේක මණ්ඩප ආදී වූ ඉදිකිරීම් සිදු කර ඇත. මෑත කාලීන කැණීම් සහ සංරක්ෂණයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් එම ඉදිකිරීම් වල තත්ත්වය පිළිබඳ අවධානය යොමු කරමින් එම ඉදිකිරීම්හී පවතින කලා ලක්ෂණ, උපයෝගීතාවය, නිර්මාණශීලීත්වය මෙන්ම විදේශ සම්බන්ධතා ආදිය ද හඳුනාගත හැකි වේ. විශේෂයෙන්ම සාහිත්‍ය මූලාශ්‍රමය සාධක සහ සෙල්ලිපි සාධක ආදිය ද ඉක්මවා යමින් අභයගිරියේ පැවති මහායානය ප්‍රමුඛ කොටගත් නිදහස් මතධාරීන්ගේ හැඩරුව කියාපාන මනා වූ නිදර්ශන වශයෙන් මෙම වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් සමූහය හඳුනාගත හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ

*පූජාවලිය*, (1953) සංස්:වේරගොඩ අමරමෝලි හිමි, කොළඹ: රත්නාකර පොත් වෙළඳහල

*මහාවංසය*, (2007) සංස්:හික්කඩුවේ සුමංගල හිමි සහ වෙනත්, දෙහිවල:බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

*ෆාහියන්ගේ දේශාටන වාර්තාව*, (2017) අනු: විමල් ජී. බලගල්ලේ, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

කුලතුංග ටී.ජී. (2014) *පුරාණ අභයගිරි විහාරය*, කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල

මහින්ද හිමි, උණුවතුරබුබුලේ, (2018) *ලංකා බෞද්ධ සංස්කෘතිය*, කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

රණවැල්ල. සිරිමල්, (2004) *සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය*, කොළඹ:පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

වික්‍රමසිංහ, දොන් මර්තිනූ ද සිල්වා. (2000) ශිලා ලේඛන සංග්‍රහය, ශ්‍රී ලංකා: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

සාරානන්ද හිමි, දුනුකේඋල්ලේ, (2014) "මහායාන බෞද්ධ ස්තූප කලාවේ ලක්ෂණ", *ප්‍රභා ශාස්ත්‍රීය සංග්‍රහය*, තුන්වැනි කලාපය, කැළණිය විශ්වවිද්‍යාලය, මානව ශාස්ත්‍ර පීඨය

සාසනරතන හිමි, මොරටුවේ. (2012) *ලක්දිව මහායාන අදහස්*, බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ

Chandawimala, Rangama, (2016) "*Heterodox Buddhism: The School of Abhayagiri*", Colombo

Mishra, Umakanta, (2015) “Abhayagiri in anuradhapura, Buddhist Diamond Trangle of Odisha and Java; Art and Epigraphic evidence of Triadic linkage of Esoteric Bhuddhism in Maritime Asia”, *proceeding of indian history congress*, vol.76

Mishra. Umakanta,” (2016) Dharanis from the Buddhist Sites of Orissa”, *Pratanatattva*, Jahanginagar University

Ranawella. G. S, (2004) *Inscriptions of Ceylon.Vol V. Part II,* Sri Lanka, Department of Archaeology

Schopen, Gregorym (1982) The Text on —Dharani Stones from Abhayagiriya— *A Minor Contribution to the Study of Mahayana Literature*, USA, Association of Buddhist Studies